# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1643/42 – 2010 මාර්තු 04 වැනි බ්‍රහස්පතින්දා – 2010.03.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

මගේ අංකය: සීඅයි/1701/2003.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2005 ජුනි මස 01 දින අංක 1395/16 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2005 මැයි මස 26 දින දරන නියෝගයෙන් එක් පාර්ශ්වයක් වශයෙන් පිටකෝට්ටේ, කෝට්ටේ පාර, අංක 416 (ඩබ්ලිව්. එම්. ආර්. ප්‍රේමසිරි මහතා), ජාතික සේවක සංගමය සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කැළණිය, කැළණිය විශ්ව විද්‍යාලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2009 ඔක්තෝබර් මස 06 වැනි දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**ඩබ්ලිව්. ජේ. එල්. යූ. විජයවීර,**<br>
කම්කරු කොමසාරිස් ජනරාල්.

2010 පෙබරවාරි මස 25 වැනි දින,<br>
කම්කරු දෙපාර්තමේන්තුව,<br>
කොළඹ 05.

නඩු අංකය: ඒ 3102.

ජාතික සේවක සංගමය, (ඩබ්ලිව්. එම්. ආර්. ප්‍රේමසිරි මහතා වෙනුවෙන්) අංක 416, කෝට්ටේ පාර, පිටකෝට්ටේ

හා

කැළණිය විශ්ව විද්‍යාලය, කැළණිය — වගඋත්තරකරු

අතර පවත්නා කාර්මික ආරාවුල පිළිබඳවයි.

කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍ය, අතාවුද සෙනෙවිරත්න මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2005 මැයි මස 26 දිනැති නියෝගයෙන් බේරුම්කරු වශයෙන් ඔනිල් පෙරේරා වන මා පත්කරනු ලැබිණි.

මෙම කාර්මික ආරාවුලට හේතු වී ඇති කාරණය වනුයේ, කැළණිය විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී විසින් එම විශ්වවිද්‍යාලයේ ආරක්ෂක නියාමයෙකු (පහළ ශ්‍රේණිය) වශයෙන් සේවය කළ ඩබ්ලිව්. එම්. ආර්. ප්‍රේමසිරි මහතා වෙත නිකුත් කරනු ලැබූ 2002 අගෝස්තු මස 01 දිනැති ලිපිය අනුව 2002 ජූලි මස 30 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔහු සිය කැමැත්තෙන් සේවය අතහැර ගියා සේ සැලකීම යුක්ති සහගත ද යන්න හා නොඑසේනම් ඔහුට කුමන සහනයක් හිමි ද යන්න පිළිබඳව වේ.

මේ සම්බන්ධයෙන් දෙපාර්ශ්වයම ඉදිරිපත් කරන ලද ප්‍රකාශයන් ගොනු කිරීමෙන් පසු පාර්ශ්වකරුවන් අතර සමථයක් නොවූ බැවින් මෙම නඩුව විභාගයට ගත්තෙමි.

මෙම නඩුවේ ඉල්ලුම්කරු මුලින්ම සාක්ෂි දෙන ලදී. තමන් 1992 අප්‍රේල් මස 01 දින සේවයට බැඳුණු බවත්, ඒ ආරක්ෂක නියාමකයකු (පහළ ශ්‍රේණිය) ලෙස බවත්, පසුව තමන්ගේ පත්වීම ස්ථිර කළ බවත් කියන ලදී. ඉල්ලුම්කරු වැඩ මුරවලට සේවය කර ඇති අතර අවසන්වරට 2009 ජූලි මස 29 දින සේවය කර ඇති අතර උදේ 7.00 සිට සවස 3.00 දක්වා වැඩ මුරයේ වැඩ කර තිබේ.

තමන්ට පාන්දර 4.30 ත් 5.00 ත් අතර සර්පයකු දශ්ඨ කිරීම නිසා ඊළඟ තමන්ගේ වැඩමුරය වන 2002 ජූලි මස 30 වැනි දින සවස 3.00 වැඩ මුරයට සහභාගිවීමට නොහැකි වූ බවත් කියන ලදී. ඒ බව විදුලි පණිවුඩයකින් දැනුම් දුන් බවත්, පසුව නැවති රාජකාරියට ගියේ ඊළඟ මස දෙවන දින බවත්, එදින තමන්ට සේවයට පැමිණීම අත්සන් කිරීමට නොදුන් බවත්, ප්‍රධාන ආරක්ෂක නිලධාරි මහතා නොදන්වා සේවයට නොපැමිණීම නිසා එසේ කිරීමට නොදෙන බව පවසන ලදී.

ඉන්පසුව තමන්ට ලේඛකාධිකාරී විසින් නොදන්වා සේවයට නොපැමිණීම මත සේවය අතහැර ගියා සේ සලකා ලිපියක් ලබා දී තිබේ.

ඉන්පසුව තමන් නැවත සේවය දෙන ලෙසට අභියාචනයක් 2002 අගෝස්තු මස 03 දින ලබා දුන්නත් නැවත සේවය ලබා නොදුන් බව පවසා සිටින ලදී.

ඉන්පසුව ඉල්ලුම්කරු කම්කරු කොමසාරිස්තුමාට යවන ලද අභියාචනයක් අනුව, 2004 වර්ෂයේ පවත්වන ලද පරීක්ෂණයක දී නැවත තමා සේවයේ පිහිටුවීමට නිර්දේශ කරන ලද බවත්, ඒ නිර්දේශය අනුව ද තමාව සේවයේ පිහිටුවනු නොලැබූ බවත්, එය නිර්දේශයක් පමණක් බවත්, නියෝගයක් නොවන බවත්, එම නිසා නැවත රැකියාව නොදුන් බවත් කියා සිටින ලදී.

ඒ අනුව නැවත හිඟ වැටුප් සමග නැවත රැකියාවේ පිහිටුවන ලෙස අභියාචනය කරන ලදී.

මෙහි ඉල්ලුම්කරු විසින් තමාගේ නඩුව සනාථ කිරීම සඳහා නඩු විභාගයේ දී කිසිම ලේඛනයක් ඉදිරිපත් කිරීම හෝ ලකුණු නොකරන ලදී.

පසුව හරස් ප්‍රශ්නවල දී වගඋත්තරකාර පාර්ශ්වය වර්ෂ 2002 අගෝස්තු මස 03 දිනැති ලිපිය R1 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලදී. එහි දී ඉල්ලුම්කරුට අනුව සර්පයා දෂ්ඨ කර ඇති දිනය පැහැදිලි නැත. "R1A" ලෙස එය ලකුණු කර ඇති අතර, දිනය වෙනස් කිරීම නිසා එය අපැහැදිලිය.

ඉන්පසුව R2 ලේඛනය මගින් නැවත වරක් රැකියාව ඉල්ලුම්කරු අභියාචනය කර තිබේ. එහි දී පැහැදිලිව සර්පයා දෂ්ඨ කළ දිනය 2002 ජූලි මස 28 වැනි දින යන්න දක්වා තිබේ. එය R2A ලෙස ලකුණු කරන ලදී.

මෙහිදී ඉල්ලුම්කරු විසින් තමාගේ නඩුව සනාථ කිරීමට විදුලි පුවත පිළිබඳ හෝ ඒ සම්බන්ධ කිසිම සාක්ෂියක්/ලේඛනයක් ඉදිරිපත් කළේ නැත. තමා වෛද්‍ය ප්‍රතිකාර ලබාගත් බව කියා සිටිය ද ඒ බව සනාථ කිරීමට කිසිම වෛද්‍ය සහතිකයක් හෝ වෛද්‍යවරයකු සාක්ෂියට කැඳෙව්වේ නැත.

මුලින් සාක්ෂි දීමේ දී සර්පයා දෂ්ඨ කළේ 2002 ජූලි මස 30 වැනි දින ලෙස සාක්ෂි දී තිබේ. R2 ලේඛනය අනුව 2002 ජූලි මස 28 දින කියා ඇත. R1 ලේඛනයේ දිනය පැහැදිලි නැත.

A4 ලෙස නඩු ගොනුවේ ඇති වෛද්‍ය සහතිකය ද මා විසින් පරීක්ෂා කර බැලුවෙමි. එහිද සර්පයා දෂ්ඨ කළ දිනය සඳහන්ව නැත. එහි ඇති දිනය 2002 අගෝස්තු මස 04 වැනි දින වන අතර එය වෛද්‍ය සහතිකය නිකුත් කළ දිනය ද සර්පයා දෂ්ඨ කළ දිනය ද පිළිබඳව යන්න සඳහන් නොවේ.

ඉල්ලුම්කරුගේ නඩුවේ මෙම ලේඛනය පවා ඉදිරිපත් කළේ නැත. සාක්ෂි මෙහෙයවූයේ නැත. එම නිසා එම ලේඛනය මා විසින් සැලකිල්ලට නොගන්නා අතර එය බැහැර කරමි.

ඉන්පසුව නැවත සේවයට වාර්තා කිරීම පිළිබඳව ද හරස් ප්‍රශ්න ඇසීමේ දී ඉල්ලුම්කරුගේ ස්ථාවරය අපැහැදිලි ලෙස සාක්ෂි දෙන ලදී. ඔහුට නැවත සේවයට වාර්තා කිරීමට ගිය දිනය ද නිවැරදිව ප්‍රකාශ කිරීමට නොහැකි වී තිබේ.

ඉන්පසුව කම්කරු දෙපාර්තමේන්තුවේ දී පැවති පරීක්ෂණයේ දී (නඩු ගොනුවේ R3) නැවත සේවයේ පිහිටුවීමට නිර්දේශ කර තිබේ. එය බැලූ බැල්මට සාධාරණය.

නමුත් මෙහි දී මෙම සේවකයාගේ පූර්ව ක්‍රියාකලාපය සැලකිල්ලට ගෙන නොමැත. මෙම පරීක්ෂණයේ දී එය මා හට අදාළ නොවූවත්, මා විසින් සලකා බැලිය යුත්තේ මෙම නඩුවට අදාළ විසඳිය යුතු ප්‍රශ්නය වූවත්, වගඋත්තරකාර පාර්ශ්වයෙන් ඉදිරිපත් කරන ලද කරුණු අනුව යුක්ති සහගත, සාධාරණ නිගමනයකට ඒම සඳහා එම කරුණු සලකා බැලීම කළ යුතුය.

එයට හේතුව R6 ලෙස ඉල්ලුම්කරුගේ පෙර වැරදි විශාල ප්‍රමාණයක් සාක්ෂි ලෙස ඉදිරිපත් කරන ලදී. එම කරුණු බිඳ හෙළීමට හරස් ප්‍රශ්න ඇසීම හෝ නොකරන ලදී. ඒ අනුව මෙම ඉල්ලුම්කරු රැකියාව හැර ගිය ලෙස සැලකීම මෙම සිද්ධියට පමණක් පාදක වී නොමැති බව පෙනී යයි.

මෙහි දී මා විසින් R/06 (i) සිට R/06 (xxxi) ලෙස ඉදිරිපත් කළ ලේඛන සැලකිල්ලට ගනිමි. එම ලේඛන වල අඩංගු කරුණු බිඳ හෙළීමට හෝ සත්‍ය, අසත්‍ය තාවය පිළිබඳව ඉල්ලුම්කරු වෙනුවෙන් කිසිම ප්‍රතිවිරෝධයක් හෝ ප්‍රශ්න කිරීමක් සිදු කළේ නැත.

ඒ කරුණු සැලකිල්ලට ගැනීමේ දී මෙම ප්‍රස්තුත සිද්ධිය ද සුළුවෙන් සැලකිල්ලට ගත නොහැක. ඒ අනුව එම ලේඛන සම්බන්ධයෙන් වර්ෂ 2009.03.31 දින ඉල්ලුම්කරුගෙන් අසන ලද හරස් ප්‍රශ්න කෙරෙහි මාගේ විශේෂ සැලකිල්ල යොදුවෙමි. ඒ අනුව ඉදිරිපත් වූ සාක්ෂි හා සියලුම කරුණු සැලකිල්ලට ගැනීමේ දී මෙම ඉල්ලුම්කරු සේවයට නොපැමිණීම පිළිබඳ පිළිගත හැකි සාධාරණ හේතුවක් ඉදිරිපත් කර නොමැති බවට තීරණය කරමි.

**Calcutta Homeopathic Medical College and Hospital Vs their Workmen (1961) 2F. L. R. 520**

නඩුවේ සඳහන් කර ඇති කරුණු අනුව :–

The Hospital authorities dismissed an employee for absence from duty without notice, which absence cause serious inconvenience and considerable hardships to patients and dislocation of work of the hospital. From the employee's evidence before the tribunal it was clear that the workmen had not applied for leave.

There was nothing to show that he had been granted leave prior to his leaving his place of work. It was clear that the hospital authorities were unaware of the function of the worker's union. There can therefore be no question of victimization or malice on the part of the Hospital authorities, and in those circumstances it was held that the dismissal was justified and that the employee was not entitled to any relief.

ඒ අනුව මෙම ඉල්ලුම්කරුගේ ක්‍රියාකලාපය දෙස ආරම්භයේ සිටම බැලීමේ දී තමන් අයිතිවාසිකමක් ලෙස නිවාඩු ලබා ගෙන ඇති බව පෙනේ. අවස්ථා කිහිපයක දී ම එනම්, R ලෙස ලකුණු කළ ලේඛන සලකා බැලීමේ දී පෙනී යන්නේද, තවද නඩු විභාගයේ දී ඉල්ලුම්කරු එම කරුණු පිළිගෙන තිබේ.

එම නිසා මෙසේ ඉල්ලුම්කරු නිවාඩු ලබා නොගෙන සේවයට වාර්තා නොකිරීම, සේවය අතහැර ගියා සේ සැලකීම සාධාරණ හේතු වගඋත්තරකාර පාර්ශ්වයට තිබුණ බවට මම සෑහීමකට පත්වෙමි.

ඒ අනුව මෙම කාර්මික ආරාවුලට විෂය වී ඇති ඉල්ලුම්කාර ඩබ්ලිව්. එම්. ආර්. ප්‍රේමසිරි මහතා වෙත නිකුත් කරනු ලැබූ 2002-08-01 දිනැති ලිපිය අනුව 2002-07-30 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔහු සිය කැමැත්තෙන් සේවය අතහැර ගියා සේ සැලකීම යුක්ති සහගත බව තීරණය කරමි. මෙම තීරණය සාධාරණ සහ යුක්ති සහගත බව මගේ නිගමනය වේ.

මීළඟට මා සලකා බැලිය යුත්තේ ඉල්ලුම්කරුට වෙනත් සහන හිමිවිය යුතුද? යන්න වේ. ඉල්ලුම්කරු මෙම තමන්ගේ නඩුවේ මේ පිළිබඳ කිසිම සාක්ෂියක් මෙහෙය වීම හෝ ඉදිරිපත් කිරීම කළේ නැත. ඒ අනුව මෙම ප්‍රශ්නයට ද මා හට කිසිම නියෝගයක් කිරීමට හැකියාවක් නොමැත.

ඒ අනුව මෙම සියලු කරුණු සලකා බලා ඉල්ලුම්කරුගේ පැමිණිල්ල නිෂ්ප්‍රභ කරමි.

ඔනිල් පෙරේරා,
බේරුම්කරු.

2009 ඔක්තෝබර් මස 06 වැනි දින,

03 – 683

---

මගේ අංකය: අයිආර්/07/17/2008.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

4 (1) වගන්තිය යටතේ නියෝගය.

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව,

එක් පාර්ශ්වයක් වශයෙන්,

ලංකා වතු සේවා සංගමය, නො. 06, ඇලෝයි මාවත, කොළඹ 03.

අනෙක් පාර්ශ්වය වශයෙන්,

(1) ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, අංක 28, මුදලිගේ මාවත, කොළඹ 01, (2) වතු අධිකාරි, ගල්පිහිල්ල රාජ්‍ය වතුයාය, පන්විල,

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍ය අතාවුද සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මහරගම, පමුණුව පාර, අංක 216/8හි කේ. ඒ. ඩී. බී. කරුණාරත්න මහතා පත්කර ඔහුවෙත මෙයින් යොමු කරනු ලැබේ.

**අතාවුද සෙනෙවිරත්න,**
කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍ය.

2010 පෙබරවාරි මස 24 වැනි දින,
කොළඹ දී ය.

---

මගේ අංකය: අයිආර්/07/17/2008.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්,

ලංකා වතු සේවා සංගමය, අංක 06, ඇලෝයි මාවත, කොළඹ 03.

අනෙක් පාර්ශ්වයක් වශයෙන්,

(1) ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, අංක 28, මුදලිගේ මාවත, කොළඹ 01, (2) වතු අධිකාරි, ගල්පිහිල්ල රාජ්‍ය වතුයාය, පන්විල,

අතර ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ –

ගල්පිහිල්ල රාජ්‍ය වතුයායේ කණිෂ්ඨ වතු වෛද්‍ය සහකාර තනතුරෙහි සේවය කළ එස්. මාරසිංහ මහතාට ලංකා වතු සේවා සංගමය හා ලංකා සේව්‍යයන්ගේ සම්මේලනය අතර ඇති කර ගන්නා ලද 2004 අංක 13 දරන සාමූහික ගිවිසුමෙහි 6 වන වගන්තියේ "බී" උප වගන්තිය ප්‍රකාරව වෛද්‍ය වෘත්තික (Medical Practitioner) තනතුරට උසස්වීම ලබා නොදීම හා ඊට අනුරූපී වැටුප් තලයෙහි නොපිහිටුවීම හේතුවෙන් ඔහුට යම් අසාධාරණයක් වූයේද යන්න හා අසාධාරණයක් වූයේ නම් ඔහුට කුමන සහනයක් ලැබිය යුතුද යන්න පිළිබඳවද වේ.

**ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,**
කම්කරු කොමසාරිස්.

2010 පෙබරවාරි මස 10 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

03 – 684

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.